ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

# සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම

# බාහිර පුරප්පාඩු

උක් කෘෂිකර්මාන්තායතනය ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන දුඹුරු සීනි ඇතුලු අතුරු නිෂ්පාදන බොහෝමයක් නිෂ්පාදනය කරන ලංකාව තුළ තිබෙන විශාලතම කෘෂිකර්මාන්තායතනය ලෙස සැලකෙන සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත, සෙවනගල ඒකකයන්හි පවත්නා පුරප්පාඩු සඳහා පහත දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්දක් සහිත කාර්යශූර ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සාමාන්‍යාධිකාරී - පුරප්පාඩු 01 (පැල්වත්ත සහ සෙවනගල ඒකක 02 සඳහා)

**සුදුසුකම් සහ පළපුරුද්ද-**

- ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, අලෙවිකරණය, කෘෂිකර්ම යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් සහිත ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක්

  සමග

  ව්‍යාපාර පරිපාලනය / කළමණාකරණය සඳහා වූ පශ්චාත් උපාධියක් සමග රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

## පැල්වත්ත ඒකකයේ පවතින පුරප්පාඩු

### 01. රසඥ - ස්කාගාර දෙපාර්තමේන්තුව - පුරප්පාඩු ගණන 01

**සුදුසුකම් සහ පළපුරුද්ද -**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායනික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

  සහ

  රජයේ හෝ පිළිගත් ආයතනයක පිළිගත් රසායනාගාරයක වසර 03ක පළපුරුද්දක් සහිත වීම.

**වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.**

### 02. කළමනාකරන පුහුණු - ස්කාගාර දෙපාර්තමේන්තුව - පුරප්පාඩු ගණන 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව, සහ උද්භිද විද්‍යාව හෝ ක්ෂුද්‍ර විද්‍යාව සම්බන්ධව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**වයස - අවුරුදු 28ට අඩු විය යුතුය.**

### 03. කළමනාකරන පුහුණු - කර්මාන්තශාලා / නිෂ්පාදන අංශය - පුරප්පාඩු ගණන 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් (රසායනික විද්‍යාව විෂයක් ලෙස හදාරා) විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ රසායනික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**වයස - අවුරුදු 28ට අඩු විය යුතුය.**

## සෙවනගල ඒකකයේ පවතින පුරප්පාඩු

### 01. ප්‍රධාන අභ්‍යන්තර විගණක - පුරප්පාඩු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද -**

- ගණකාධිකරණය ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් කළමනාකරණය හෝ වාණිජ්‍ය විෂය පිළිබඳ වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

  සහ

  උපාධිය ලබා ගැනීමෙන් පසු විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් තිබීම හා ඉන්වසර 05 ක් විධායක ශ්‍රේණියේ වීම.

  හෝ

- පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ගණකාධිකරණය පිළිබඳ අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු විගනන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් තිබීම හා ඉන් වසර 05 ක් විධායක ශ්‍රේණියේ වීම.

**වයස අවුරුදු 30 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.**

### 02. රසායන ඉංජිනේරු - පුරප්පාඩු 05

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද සිව් අවුරුදු පූර්ණ කාලීන රසායන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම සහ ආශ්‍රිත සාමාජිකත්වය දැරීම ( AMIE - IESL)

  සමග

- අදාල ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නිර්දේශිත විනය පරීක්ෂණය සහ විභාගයන් සම්පූර්ණ කර සමත්ව තිබීම හා ආශ්‍රිත සාමාජිකත්වය දැරීම

  හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද රසායන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියට සමාන වූ ද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member ship) සඳහා සුදුසුකම් සපුරාලන උපාධියක් සමත්ව තිබීම.

**වයස අවුරුදු 28 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.**

### 03. යාන්ත්‍රික ඉංජිනේරු - පුරප්පාඩු 02

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද සිව් අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම සහ ආශ්‍රිත සාමාජිකත්වය දැරීම (AMIE - IESL)

  සමග

- අදාල ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නිර්දේශිත විනය පරීක්ෂණය සහ විභාගයන් සම්පූර්ණ කර සමත්ව තිබීම හා ආශ්‍රිත සාමාජිකත්වය දැරීම

  හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියට සමාන වූ ද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) සඳහා සුදුසුකම් සපුරාලන උපාධියක් සමත්ව තිබීම.

**වයස අවුරුදු 28 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.**

### 04. කෘෂිකර්ම නිලධාරී - පුරප්පාඩු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- කෘෂි විද්‍යාව / කෘෂිකර්මය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස අවුරුදු 28 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.**

ඉහත සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් මේ සඳහා පහත සඳහන් ලිපිනයට මෙම දැන්වීම පලකර දින 14 ක් ඇතුලත අයදුම්පත් යොමු කරන්න. (අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.)

**සභාපති**
**සී/ස ලංකා සීනි (පුද්) සමාගම**
**අංක 27, මෙල්බර්න් ඇවනියු, කොළඹ 04,**
**ශ්‍රී ලංකාව**

SELACINE